# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 78 —1973 සැප්තැම්බර් 21 වැනි සිකුරාදා — 1973.09.21

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 946 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන පත් කිරීම් ආදිය ... | — | මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත් කිරීම් ආදිය ... | 943 | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත් කිරීම් ආදිය ... | 944 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශන ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 945 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 954 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — | " සුරාබද්ද ආඥාපනත " පිළිබඳ දැන්වීම් ... ... | — |


සැළකිය යුතුයි.—(i) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 34 දරණ බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 35 දරණ අධ්‍යාපන (පදවිනාම වෙනස් කිරීමේ) පනත, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 36 දරණ මෝටර් ගමනාගමන (සංශෝධන) පනත, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 37 දරණ රජයේ වැඩ අධ්‍යක්ෂ (නිල නාමය වෙනස් කිරීම) පිළිබඳ පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 38 දරණ මහ නගර සභා (සංශෝධන) පනත 1973 සැප්තැම්බර් 21 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ. (ii) ජාතික ලේඛනාරක්ෂක පනත් කෙටුම්පත, මුදල් පනත් කෙටුම්පත, ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩල පනත් කෙටුම්පත සහ ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතන (සංශෝධන) පනත් කෙටුම්පත, 1973 සැප්තැම්බර් 14 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය

1973 අංක 449

අමප. 316/73

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් නිලධාරීන් ස්වකීය පත්වීම්වල ස්ථිර කර ඇත:—

දකුණු කොළඹ අතිරේක මහේස්ත්‍රාත්, ඊ. ඒ. විජේකුලසූරිය මහතා ශ්‍රී ලංකා අධිකරණ සේවයේ නිලධාරියෙකු වශයෙන් 1970 අප්‍රේල් මස 1 වැනි දින සිට.

කොළඹ, අතිරේක මහේස්ත්‍රාත්, වී. එන්. ඒ. ඩබ්ලිව්. වික්‍රමසූරිය මහතා ශ්‍රී ලංකා අධිකරණ සේවයේ නිලධාරියෙකු වශයෙන් 1970 ජූනි මස 10 වැනි දින සිට.

රත්න, ගම්බද උසාවි සභාපතිනි, පී. එස්. රාමචන්ද්‍ර මහත්මිය දිවයිනෙහි ගම්බද උසාවි සභාපතිවරියක් වශයෙන් 1970 ජූනි මස 1 වැනි දින සිට.

එම්. එස්. අලීෆ්,
අමාත්‍ය මණ්ඩල ලේකම්.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
කොළඹ 1,
1973 සැප්තැම්බර් මස 4 වන දින.

9-500 —73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරයෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු මස 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

# ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.—බී. 7/63.

**1963 අංක 4 දරන දේශීය ආදායම් පනත**
16අ වගන්තිය යටතේ දැන්වීම

1969 අංක 6 දරණ පනතින් සංශෝධිත, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16අ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් ඇමති නානායක්කාරපතිරගේ මාටින් පෙරේරා වන මම, "ජාත්‍යන්තර භික්ෂු අභ්‍යාස ආයතනයේ ගොඩනැගිලි අරමුදල" එකී වගන්තියේ කාර්යයන් සඳහා පිළිගත් පුණ්‍යායතනයක් යයි මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් ඇමති.

1973 සැප්තැම්බර් මස 10 වැනි දින,
කොළඹ 1.

9-606 /1—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

එල්.ඩී.—බී. 7/63.

**1963 අංක 4 දරන දේශීය ආදායම් පනත**
16අ වගන්තිය යටතේ දැන්වීම

1969 අංක 6 දරන පනතින් සංශෝධිත. 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16අ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති නානායක්කාරපතිරගේ මාටින් පෙරේරා වන මම, "රාමනාදන් විද්‍යාලයීය ගුරු දෙගුරු සංගමයේ පාඨශාලා ගොඩනැගිලි අරමුදල" එකී වගන්තියේ කාර්යයන් සඳහා පිළිගත් පුණ්‍යායතනයක් යයි මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් ඇමති.

1973 සැප්තැම්බර් මස 10 වැනි දින,
කොළඹ 1.

9-606 /2—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

එල්.ඩී.—බී. 7/63.

**1963 අංක 4 දරන දේශීය ආදායම් පනත**
16අ වගන්තිය යටතේ දැන්වීම

1969 අංක 6 දරන පනතින් සංශෝධිත, 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 16අ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති නානායක්කාරපතිරගේ මාටින් පෙරේරා වන මම, "කෝට්ටගොඩ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව" එකී වගන්තියේ කාර්යයන් සඳහා පිළිගත් පුණ්‍යායතනයක් යයි මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් ඇමති.

1973 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ 1.

9-519 —73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

**1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනත**

1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනතේ 48 (1) වන වගන්තිය යටතේ, නැව් කටයුතු හා සංචාරක කටයුතු ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාව.

පී. බී. ජී. කලුගල්ල,
නැව් කටයුතු හා සංචාරක කටයුතු ඇමති.

1973 අගෝස්තු 24 වෙනි දින,
කොළඹ දී ය.

ආඥාව

1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනතේ 48 (1) වගන්තිය යටතේ පනවනු ලැබ, අංක 14,702 සහ 1966 ජූලි 1 දින දරන ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබුවාවූද, අංක 14,844/5 සහ 1969 මාර්තු 10 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළවූ ආඥාවෙන් සංශෝධනය කරනු ලැබුවාවූද, අංක 15,011 සහ 1972 මැයි 19 දිනැති ගැසට් පත්‍රයෙහි පළකරන ලද ආඥාවෙන් තවදුරටත් සංශෝධනය කරනු ලැබුවාවූද ආඥාව මතු දැක්වෙන පරිදි තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) (ඊ) ඡේදයෙහි (iv) උප ඡේදයට පසුව, ඊට ආසන්නයෙන්ම එළඹෙන ඡේදය ලෙස මතු දැක්වෙන නව ඡේදය ඇතුළත් කිරීමෙන් :—(v) 'බැංකු සේවාවන්';

(2) (අ) 'දේශාටන නියෝජිත' යන වචන මාලාවේ අර්ථ නිරූපනයෙහි 'හුදෙක් ලංකාව ඇතුළත පමණක් චාරිකා කිරීම' යන වචන වෙනුවට 'ශ්‍රී ලංකාව කරා පැමිණෙන්නාවූ සහ/හෝ විදේශීය චාරිකාවන්හි යෙදෙන්නාවූ ශ්‍රී ලංකා නේවාසිකයින්'; යන වචන ආදේශ කිරීමෙන්,

(ආ) එම අර්ථ නිරූපනයෙහි (ඇ) කොටසට පසුව, ඊට ආසන්නයෙන්ම එළඹෙන ඡේදය ලෙස මතු සඳහන් කොටස ඇතුලත් කිරීමෙන් :—
'(ඈ) සියළු ගාස්තු ඇතුළත් පදනමක් මත හෝ කොමිස් මුදල් ලැබීමේ පදනමක් මත විනෝද චාරිකා හෝ ගමන්වලට අදාල චාරිකා බලපත් අලෙවි කිරීමෙන් සහ අදාල සේවාවන්, පහසුකම් සැපයීමෙන්, එවැනි චාරිකා හෝ ගමන් සංවිධානය කිරීම.'

(ඇ) එම උපලේඛනයෙහි හයවැනි කොටසෙහි දැක්වෙන 'ලංකාව' යන වචනය වෙනුවට 'ශ්‍රී ලංකාව' යන වචන ආදේශ කිරීමෙන්, සහ

(ඈ) එම උපලේඛනයෙහි අගට "ශ්‍රී ලංකා ගුවන් හමුදාව' යන නව කොටස එකතු කිරීමෙන්.

9-578 —73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

**බලතල පැවරීම—රාජ්‍ය නිලධාරීන් පත් කිරීම**

ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති, රණවකආරච්චිගේ සොලමන් පෙරේරා වන මම, ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 113 හා 114 වැනි වගන්තිය යටතේ වූ පත් කිරීම් ද, ඒකාබද්ධ සේවාවන්ගෙන් කිසිවකට පත් කිරීම්ද හැර, ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයෙහි සියළුම තනතුරුවලට පත් කිරීම් කිරීමේ බලය අමාත්‍ය මණ්ඩලය විසින් මා වෙත පවරා දී තිබෙන්නා වූ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 115(1) වැනි වගන්තිය සමග කියවනු ලබන ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 116 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, මෙහි I වැනි තීරයෙහි නිශ්චිතව දක්වා තිබෙන්නා වූ අමාත්‍යාංශයෙහි හෝ දෙපාර්තමේන්තුවෙහි සේවය කරන්නා වූ වර්ෂයකට රු. 6,720 කට අඩු ආරම්භක වැටුපක් සහිත වැටුප් පරිමාණයන් හිමි සියළුම රාජ්‍ය නිලධාරීන් පත් කිරීමේ බලය. අමාත්‍ය මණ්ඩලය විසින් හෝ රාජ්‍ය පරිපාලනය භාරව සිටින ඇමතිවරයා විසින් හෝ මා විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලැබිය හැකි උපදෙස්වලට යටත්ව මෙහි වූ II වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා තිබෙන්නා වූ රාජ්‍ය නිලධාරියාට මෙයින් පවරමි.

ආර්. ඇස්. පෙරේරා,
ප්‍රවෘත්ති හා ගුවන් විදුලිය ඇමැති.

1973 සැප්තැම්බර් මස 6 දින,
ප්‍රවෘත්ති හා ගුවන් විදුලිය අමාත්‍යාංශය,
කොළඹ 1.

උපලේඛනය

| තීරය I | තීරය II |
|---|---|
| (i) ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශය | (i) ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයේ ලේකම්. |
| (ii) ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | (ii) ප්‍රවෘත්ති අධ්‍යක්ෂ. |
| (iii) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | (iii) රජයේ මුද්‍රණාලයාධිපති. |

9-574 —73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

### මිල පාලන පනත

රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) විසින් පනවනු ලැබ, 1973 අගෝස්තු මස 03 වැනි දින අංක 71 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක ර/1/73 දරන මිල නියෝගය (අතිරේක ආහාර ද්‍රව්‍ය-ධාන්‍ය ඇට වර්ග) විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යවරයා විසින් 1973.09.04 දින අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 4 (7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1973. 09. 05 දින,
කොළඹ.

9–572—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

### මිල පාලන පනත

1973 ජූලි මස 05 වැනි දින අංක 66/55 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද පහත සඳහන් මිල නියෝග විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යවරයා විසින් 1973. 09.05 දින අනුමත කරනු ලැබූ බව (173 වන අධිකාරය වන) මිල පාලන පනතේ 4 (7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. අම්පාර පරිපාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක විසින් පනවන ලද අංක ආපා/5/27 (2)/73 දරන ආහාර මිල නියෝගය (පාන්) සහ අංක ආපා/5/13 (2)/73 දරන මිල නියෝගය තිරිඟු පිටි) :

2. කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිල පාලක විසින් පනවන ලද අංක කෝ ඊ. 133 දරන ආහාර මිල නියෝගය (තිරිඟු පිටි) සහ අංක කෝ ඊ.134 දරන මිල නියෝගය (පාන්) ;

3. වව්නියාව පරිපාලන දිස්ත්‍රික්කයේ සහකාර මිල (ආහාර) පාලක විසින් පනවන ලද, අංක වී-115 දරන මිල නියෝගය (තිරිඟු පිටි).

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1973.09.05 දින,
කොළඹ.

9–570—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

### මිල පාලන පනත

1973.06.23 දින අංක 65/1 දරන ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පහත සඳහන් මිල නියෝග විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යවරයා විසින් 1973.09.04 දින අනුමත කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතේ 4 (7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ සහකාර මිල (ආහාර හා විවිධ ද්‍රව්‍ය) පාලක විසින් පනවන ලද අංක කේ එල් 4 දරන ආහාර මිල නියෝගය (පාන්) :

2. නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිල පාලක විසින් පනවන ලද අංක ඇන් ඊ/115 දරන ආහාර මිල නියෝගය(තිරිඟු පිටි) සහ අංක ඇන් ඊ/116 දරණ ආහාර මිල නියෝගය (පාන්) ;

3. ත්‍රිකුණාමලය පරිපාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිල පාලක විසින් පනවන ලද අංක ටි/මිපා/7 දරන ආහාර මිල නියෝගය (පාන්) සහ අංක ටි/මිපා/6 දරණ ආහාර මිල නියෝගය (තිරිඟු පිටි) ;

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1973.09.05 දින,
කොළඹ.

9–569—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

### මිල පාලන පනත

මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) විසින් පනවනු ලැබ, 1973. 08. 11 වැනි දින අංක 70/51 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද 1973 අංක 3 දරණ (ජේපෝමික් ඇසිඩ්) මිල පාලන ආඥාව, විදේශීය හා දේශීය වෙළඳ ඇමතිවරයා විසින් 1973.09.04 වැනි දින අනුමන කරනු ලැබූ බව (173 වැනි අධිකාරය වන) මිල පාලන පනතෙහි 4 (7) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජයන්ත කැලේගම,
ලේකම්,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශය.

1973 සැප්තැම්බර් මස 6 වැනි දින,
කොළඹ දී ය.

–6 44—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

### උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමෙ පනත

5 වන වගන්තිය යටතේ නිවේදනය

(110 වන අධිකාරය වන) උප්පැන්න හා මරණ ලියා පදිංචි කිරීමේ පනතේ 5 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, 1935 සැප්තැම්බර් 20 වෙනි දින අංක 8,146 දරන ගැසට් පත්‍රයේ අතිරේකයෙහි පල කරනු ලැබ කලින් කළ සංශෝධනය කරනු ලැබූ නිවේදනය, එහි වූ උප ලේඛනයෙහි ''වයඹ පළාත—කුරුණෑගල දිස්ත්‍රික්කය'' යන ශීර්ෂය යටතේ:—

(1) හතලිස් පහ නැගෙනහිර කෝරලේ කොට්ඨාශයට අදල අංක 26 දරන විෂය වෙනුවට මෙහි වූ ''අ'' උප ලේඛනයෙහි සඳහන් විෂය ආදේශ කිරීමෙන්, හා

(2) අංක 26 දරණ විෂයයට ඉක්බිතිවම මෙහි ''ආ'' උප ලේඛනයේ සඳහන් 26 අ දරන විෂය ඇතුලත් කිරීමෙන්,

1973.10.1 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නිවේදනයෙන් සංශෝධනය කරමි.

ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යවරයා.

1973 අගෝස්තු මස 24 දින,
කොළඹ දීය.

### ''අ'' උප ලේඛනය

26—පහත සඳහන් ගම්වලින් සමන්විත හතලිස් පහ නැගෙනහිර කෝරලේ උතුරු කොට්ඨාශය :—

| | |
|---|---|
| අලපත් වැව | දන්ගහ වැව |
| අලුත් වැව | දෙමටගස් වැව |
| අන්දර වැව | දිවුල්ගනේ |
| බක්මීකල්ල | ඇහැටුවැව |
| බලතියන්ගම | ගාලේවැව |
| බමුනුගම | ගැටිලැව |
| බෝගස්වැව | ගිරාතලාන |
| බෝන්ගම | ගොන්නගම |
| බුල්නෑව | හල්මිල්ලවැටිය |
| දලුපතගම | හම්මිල්ලැව |
| හිද්දෑව | නවගත්තේගම |
| හීරලුගම | නීලකුඹටියාව |
| ඉහල දිගනේ | නිතලව |
| ඉහල දිවුල්ගනේ | නිතෝගම |
| ඉහලගම | ඕබඩයාගම |
| ඉහලගම | ඕලුපැලියාගම |
| ඉහල වැලියාව | පහලදිගනේ |
| කඩදූන්නෑව | පහලගම |
| කරඹෑව | පහලගැටිලැව |

| | |
|---|---|
| කරුවලගස්වැව | පහල හීරලුගම |
| කරුවලවැව්ගොන්න | පහල සියඹලෑව |
| කටුගම්පලගම | පලුගහවැව |
| කෝනාරගම | පලුගස් වැව |
| කෝන්වැව | පත්තිනිගම |
| කුඩාකන්නෝරුව | පොතානේගම |
| කුඩානිතලව | රුස්වෙහෙර |
| ලෝකුරුගම | තම්මිටගම |
| මහකන්නෝරුව | තනහේන |
| මයිලගස්වැව | තිඹිරිකඩවල |
| මකරගම | තිඹිරිපිටිය |
| මකුලෑව | උඩ සියඹලෑව |
| මැදගම | වල්පාලුව |
| මැදින්නෝරුව | වල්පාලුව |
| මැටිගැන්නෑව | වේදෙනිගම |
| මීගස්වැව | වැලියාව |
| මොලෑගම | විකාදෙනිගම |
| මොරොත්තේගම | වීරමුනියාගම |
| මූදියන්නෑගම | |

"ආ" උප ලේඛනය

26 අ. පහත සඳහන් ගම්වලින් සමන්විත හතලිස් පහ නැගෙනහිර කෝරලේ දකුණු කොට්ඨාශය:—

| | | |
|---|---|---|
| ආවිරිගම | හම්මිල්ලෑව | මොරොත්තේගම |
| ආවිරිකෝන්වැව | හේනේගෙදර | නබඩෑව |
| අළුත්වැව | හෙට්ටිගම | නාකොලගනේ |
| අමුනුවෙල | හීන්කෙන්දව | නැකතිකෝන්වැව |
| අන්දරවැව | හිරිගොල්ලේගම | නිකවැව |
| අන්දරවැව | | |
| අඩියාගම | හුන්නෑගම ඇතුළු සින්නාවාරියාගම | නිලුස්වැව |

| | | |
|---|---|---|
| අහමොලේ | හුනුගල්ලෑව | පහලඇඹෝගම |
| අංගමුව | හුණුගල්ලෑව | පල්ළුරියාව |
| අගුරුවැල්ල | ඉහල ඇඹෝගම | පලුගහකොටුව |
| අස්සැද්දුම | ඉකිරිවත්තේගම | පන්නගම |
| අතරගල්ල | කඩවල | පතිගිවත්ත |
| අත්තනපොල | කඳුරුවැව | පොල්පිතිගම |
| බඩල්ගම | කපුවෑගම | රංචාගොඩයාගම |
| බැදිගම | කරුවලගහමුලවැව | රස්නගෙගම |
| දලුපත | කරුවලගස්වැව | රත්න දිවුල්ලෑව |
| දඹුවැල්ලෑව | කත්තරගම | රුක්අත්තන දලුපොත |
| දික්වැන්නෑගොඩ | කැතිරිගොඩයාගම | රුක්මල් ගහදලුපොත |
| දිසානක්ගම | කැලේගම | සියඹලාගහ දලුපොත |
| ඇහැටුවැව | කිරිබත් පැලැස්ස | සියඹලාගස්වැව |
| එරියාව | කිවුලේගම | තලාකොලවැව |
| ඇතිනිමොලේ | කොතලවැටිය | තුම්පැලපිටිය |
| ගල්අමුන | කොටුවේකුඹුර | තුත්තිරිපිටිය |
| ගලපිටදිගනේ | කුඩාගලේවැව | උඩකොටුව |
| ගලපිටගම | කුඩාගම | උල්පොත |
| ගලපිටවෙල | කුඩාහේනේගෙදර | උල්පොතගම |
| ගල්කඩවල | කුඹුක්ගහ වැව | වලත්වැව |
| ගල්කැටිතම්මැන්නෑව | කුඹුක්කඩවල | වල්මීන්නෑව |
| ගල්කැටියාව | ලියනගෙගම | වල්පාලුවත්ත |
| ගල්ලෑව | මඩදෙනිගම | වරටක්ගම |
| ගනේගම | මහඇඹෝගම | වෑගෙදරගම |
| ගනේපොතාන | මහගාලේවැව | වෙල්කොටුවැව |
| ගැඩුමගස්වැව | මහගම | වැටකොලුවැව |
| ගෝනමඩිත්ත | මහමේරුව | වැටියෙගෙදර |
| ගුරුගොඩ | මානක්කුලයාගම | වැව්ගොන්න |
| හබයාසේවැව | මිදෙල්ලගහ වත්ත | |
| | මිදෙල්ලගහ වත්ත | |
| | මිගස්පිටිය | |
| | මීගස්වැව | |

9-571—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනත
4 (1) වගන්තිය යටතේ නියමය

1968 අංක 14 දරණ සංචාරක සංවර්ධන පනතෙහි 4 (1) වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර. නැව් කටයුතු හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යවර. **පුංචි බණ්ඩා ගුණතිලක කළුගල්ල** වන මම, කෘෂිකර්ම හා ඉඩම් ඇමතිතුමාගේ එකඟත්වය ඇතුව, 1966 අංක 10 දරණ පනතින් පිහිටුවන ලද රජයේ සංස්ථාවක් වන ලංකා සංචාරක මණ්ඩලයේ, සංචාරක සංවර්ධන යෝජනා ක්‍රමයක කාර්යයන් උදෙසා, මිතු දැක්වෙන ප්‍රථම උප ලේඛනයෙහි නිශ්චිත ලෙස සඳහන් ඉඩම්, මිතු දැක්වෙන දෙවැනි **උප ලේඛන**යෙහි දැක්වෙන කොන්දේසිවලට යටත් කොට, 1973 සැප්තැම්බර් මස 11 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, එකී මණ්ඩලය වෙත මෙම නියමය මගින් පවරමි.

පී. බී. ජී. කළුගල්ල,
නැව් කටයුතු හා සංචාරක කටයුතු ඇමති.

1973 සැප්තැම්බර් 11 වැනි දින දී ය.
කොළඹ.

ඉහතකී 1 වැනි උප ලේඛනය

මැද පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ආ. ආ. නි. කොට්ඨාශයෙහි, ග්‍රාම සේවක කොට්ඨාශ අංක ඊ. 455 හි, සිඳුරංගල ග්‍රාමයෙහි පිහිටි,

උතුරින්—පිපී 16 දරණ පිඹුරෙහි කැබලි අංක 249,

නැගෙනහිරින්—පිපී 16 දරණ පිඹුරෙහි කැබලි අංක 249,

දකුණින්—පිපී 16 දරණ පිඹුරෙහි කැබලි අංක 242 හා

බටහිරින්—පිපී 16 දරණ පිඹුරෙහි කැබලි අංක 247

යන සීමාවලින් මායිම්වූ ප්‍රමාණයෙන් අක්කර දහනවයයි රූඩ් තුනයි පර්චස් තිස් අටක් වූ (අ. 19 රූ. 3 ප. 38) පිපී 16 දරණ පිඹුරෙහි කැබලි අංක 248 ලෙස දැක්වෙන, බුලනයාය යැයි හැඳින්වෙන බිම් කොටස.

ඉහතකී 2 වැනි උප ලේඛනය

1. පළමුවැනි උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩමෙහි සංවර්ධනය පුරාවස්තු ආඥා පනතෙහි, ව්‍යවස්ථා ප්‍රඥප්තියේ 188 වැනි පරිච්ඡේදයෙහි විධිවිධානයනට සහ ඉහතකී ආඥා පනතෙහි, මූලධර්ම සහ විධිවිධානයන්, **ක්‍රියාත්මක කිරීමේ හෝ බල පැවැත්වීමේ කාර්යය** පිණිස, එම ආඥා පනතේ නියමයන් අනුව, සකසා ඇති හෝ සකසනු ලබන ඕනෑම රෙගුලාසියකට හෝ යටත් විය යුතුය.

2. ඉහතකී ඉඩමෙහි, ඉදිකරනු ලබන සෑම ගොඩනැගිල්ලක් ම, පුරා විද්‍යා කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇති සහ ඔහුගේ අනුමැතිය ලත් සැලසුම් වලට අනුකූලවිය යුතුය.

9-581—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

සමගි මණ්ඩල පනත

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කිය විය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 2 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින් නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම, මිට යාකොට ඇති උප ලේඛනයෙහි නිශ්චිතව සඳහන් ප්‍රදේශ තුළ එකී පනත ක්‍රියාත්මක විය යුතුයැයි මෙයින් නිශ්චය කරමි.

**රත්නසිරි වික්‍රමනායක,**
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 සැප්තැම්බර් මස 07 වැනි දින.
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

1. යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි පණ්ඩතෙරුප්පු සුළු නගර සහා ප්‍රදේශය.
2. යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි මානිපේ සුළු නගර සභා ප්‍රදේශය.
3. යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි චුන්නාකම් සුළු නගර සභා ප්‍රදේශය.
4. යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි උරුම්පිරායි-ඌරෙලු සුළු නගර සහා ප්‍රදේශය.
5. මඩකලපුව දිස්ත්‍රික්කය තුළ පිහිටි ඒරාවූර් සුළු නගර සභා ප්‍රදේශය.
6. කළුතර දිස්ත්‍රික්කය තුළ පිහිටි ධර්ගා ටවුන් සුළු නගර සභා ප්‍රදේශය.
7. යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි චන්කානෙයි සුළු නගර සභා ප්‍රදේශය.
8. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ පිහිටි කන්තලේ සුළු නගර සභා ප්‍රදේශය.
9. කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි මීගමුව මහ නගර සභා ප්‍රදේශය.

9-580—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

## සමගි මණ්ඩල පනත

### ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කිය විය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1969 මැයි මස 9 වැනි දින අංක 14,853 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ ඇන්වීමේ උප ලේඛනයෙහි අංක 2 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ නුවරඑළිය දිස්ත්‍රික්කය තුල පිහිටි ගන්නෑව බටහිර ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි:—

(1) පල්ලේබෝවල, බඹරගම පදිංචි වික්‍රමසිංහ මුදියන්සේලාගේ කිරිබණ්ඩා වික්‍රමසිංහ මහතා.

(2) පල්ලේබෝවල, බෝවල පදිංචි රාජනායක මුදියන්සේලාගේ හිප්පලගෙදර වීරකෝන් බණ්ඩා මහතා.

(3) පල්ලේබෝවල, බඹරගම, දෙළුන්ගහකොටුව පදිංචි නිමල් රාජපක්ෂ ද සිල්වා මහතා.

(4) පල්ලේබෝවල, බඹරගම පදිංචි ජයසේකර මුදියන්සේලාගේ අරාවේ ගෙදර අපප්පුහාමි මහතා.

(5) පල්ලේබෝවල, කිතුල්පේ පදිංචි පල්කඩ ගෙදර පියසේන මහතා.

(6) පල්ලේබෝවල, මැදගම පදිංචි හපුවල මුදියන්සේලාගේ හීන්බණ්ඩා මහතා.

(7) පල්ලේබෝවල, කිතුල්පේ පදිංචි වික්‍රමසිංහ මුදියන්සේලාගේ පුංචිබණ්ඩා වික්‍රමසිංහ මහතා.

(8) පල්ලේබෝවල, බෝවල පදිංචි බත්තන වලව්වේ සෙනෙවිරත්න බණ්ඩා මහතා.

(9) පල්ලේබෝවල, සිල්වත්ගම පදිංචි ඇලමුරේ මුදියන්සේලාගේ වික්‍රමසිංහ මහතා.

(10) පල්ලේබෝවල, කිතුල්පේ පදිංචි සිරිවර්ධන මුදියන්සේලාගේ රන්බණ්ඩා මහතා.

(11) පල්ලේබෝවල, මැදගම පදිංචි ගොඩිගම අරාවේ ගෙදර දාවිත් සිංඤෝ මහතා.

(12) පල්ලේබෝවල, කොස්ගහදෙබල පදිංචි සිරිවර්ධන මුදියන්සේලාගේ කංකානම් ගෙදර මුතුබණ්ඩා මහතා.

(13) පල්ලේබෝවල, බෝවල පදිංචි රාජනායක මුදියන්සේලෑ හීන්බණ්ඩා මහතා.

(14) පල්ලේබෝවල, ගන්නෑව උඩගම පදිංචි කැකුලන්දර මුදියන්සේලාගේ උඩවෙල ගෙදර උක්කුබණ්ඩා මහතා.

(15) පල්ලේබෝවල, ගන්නෑවඋඩගම පදිංචි වීරසිංහ මුදියන්සේලාගේ පුංචිබණ්ඩා මහතා.

(16) පල්ලේබෝවල, ගන්නෑවඋඩගම පදිංචි කැකුලන්දර මුදියන්සේලාගේ උඩවෙල ගෙදර රන්බණ්ඩා මහතා.

(17) පල්ලේබෝවල, ගන්නෑවඋඩගම පදිංචි කැකුලන්දර මුදියන්සේලාගේ උඩවෙල ගෙදර හීන්බණ්ඩා මහතා.

(18) පල්ලේබෝවල, ගන්නෑවඋඩගම පදිංචි කැකුලන්දර මුදියන්සේලාගේ කළුබණ්ඩා කැකුලන්දර මහතා.

(19) පල්ලේබෝවල, ගන්නෑවඋඩගම, මැදගම්මැද්ද පදිංචි කැකුලන්දර මුදියන්සේලෑ ගෙදර කුඹුරේ ගෙදර සිංගිරිබණ්ඩා මහතා.

(20) පල්ලේබෝවල, කොට්කාම්බේ පදිංචි අලකොලදෙනියේ කංකානම්ගේ සරත් විජේරත්න මහතා.

(21) පල්ලේබෝල, උඩබෝවල පදිංචි හේරත් මුදියන්සේලාගේ මැදගෙදර උක්කුබණ්ඩා මහතා.

(22) පල්ලේබෝවල, ගන්නෑවඋඩගම, මලන්වත්ත පදිංචි යාපා මුදියන්සේලෑ අඹගස්පිටියේ ගෙදර කුඩාබණ්ඩා උඩගම මහතා.

(23) පල්ලේබෝවල, ගන්නෑව උඩගම, මලන්වත්ත පදිංචි නම්බුකාර වසම් අප්පුවා බදුගේ ගුණපාල මහතා.

(24) හේවාහැට, කරාමිදුල පදිංචි නල්ලපෙරුම මුදියන්සේලාගේ රම්බණ්ඩා මහතා.

(25) හේවාහැට, කරාමිදුල පදිංචි රණසිංහ මුදියන්සේලාගේ තැන්නේවත්තේ ගෙදර කිරිබණ්ඩා මහතා.

(26) හේවාහැට, දාරාඹය පදිංචි වික්‍රමසිංහ මුදියන්සේලාගේ මැදගෙදර පුංචිබණ්ඩා මහතා.

(27) හේවාහැට, දාරාඹය පදිංචි දේවනෙත්තිගේ පොරෝලිස් ද සිල්වා මහතා.

(28) හේවාහැට, හෝව්වත්ත පදිංචි දලදාගෙදර ලෙස්ලි ආරියදාස මහතා.

(29) හේවාහැට, හෝව්වත්ත පදිංචි ඒකනායක මුදියන්සේලාගේ හැරල්ඩ් සේනාරත්න මහතා.

(ආ) පල්ලේබෝවල, බඹරගම පදිංචි වික්‍රමසිංහ මුදියන්සේලාගේ කිරිබණ්ඩා වික්‍රමසිංහ මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 සැප්තැම්බර් මස 07 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදී ය.

9-579/1—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

## සමගි මණ්ඩල පනත

### ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කිය විය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3 (1), 3 (8) හා 4 (1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1971 පෙබරවාරි මස 19 වැනි දින අංක 14,946 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ ඇන්වීමේ උප ලේඛනයෙහි අංක 21 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ මහනුවර දිස්ත්‍රික්කය තුල පිහිටි මැදසියපත්තුව (හා. ප.) ගම් ප්‍රදේශයේ සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි.

(1) කුඹුරේගෙදර, නියංගොඩ බඹරදෙනියේ ශ්‍රී මේධානන්ද හිමි.

(2) හා. ප. මැදවල, අංගොඩ, බෝධිරාජාරාමය හි පූජ්‍ය හිනාගම ශාසනධජ හිමි.

(3) හා. ප. මැදවල, බෝතොට පුරාණ විහාරය හි පූජ්‍ය බෙන්තර ශ්‍රී සංඝරක්ඛිත සෝමානන්ද හිමි.

(4) හා. ප. මැදවිල, දොරණෑගම, අංක 151 හි පදිංචි කදුරේ බිණ්ඩාරනායක වලව්වේ ලොකුබණ්ඩා දොරණෑගම මහතා.

(5) වැරැල්ලගම, අරණේගම, අංක 172 හි පදිංචි කරුණා පෝලිගෙදර චාර්ලි මහතා.

(6) හා. ප. මැදවිල පදිංචි මැදවල උඩතුම්පැලේ ජිනදාස මහතා.

(7) හා. ප. මැදවල, පල්ලේ ඉහගම අංක 98 හි පදිංචි රන්කොත් ගෙදර පියදාස මහතා.

(8) වැරැල්ලගම, රන්දිලිගම, අංක 209 හි පදිංචි සේපාල මුදියන්සේලා ගේ සෙනෙවිරත්න මහතා.

(9) හා. ප. මැදවල, බෝතොට, දොඩම්පිටියකඩේ, අංක 1/54 හි පදිංචි දොඩම්තැන්නේ ගෙදර පියදාස මහතා.

(10) වැරැල්ලගම, හැදෙනිය, අංක 17 හි පදිංචි හපුගොඩ ගෙදර සේතුවා මහතා.

(11) හා. ප. මැදවල, දොරණෑගම පාර, අංක 77 හි පදිංචි වාසල මුදියන්සේලාගේ රම්බණ්ඩා මැදගොඩ මහතා.

(12) හා. ප. මැදවල, අංක 76 හි පදිංචි විජේසුන්දර මුදියන්සේලාගේ විජේතුංග මහතා.

(13) හා. ප. මැදවල, අත්තරගම, අංක 55/9 හි පදිංචි පල්ලේ පිටියේ අරඹේ ප්‍රේමදාස මහතා.

(14) හා. ප. මැදවල, පැනහැටපොල, අංක 290 හි පදිංචි කුඹුරේ ගෙදර ලොකු බණ්ඩා මහතා.

(15) වැරැල්ලගම, පල්කුඹුර, අංක 108/1, බිලිංචිගහගෙදර සුලේමා ලෙබ්බේ මුහම්මදු හසන් මහතා.

(16) වැරැල්ලගම, කරඳුවාවල, ලියන්ගහජනපදය පදිංචි විජයලත්ගේ සමරසිංහ මහතා.

(17) හා. ප. මැදවල, අත්තරගම, අංක 103 හි පදිංචි පොල්ගොල්ලේ ගෙදර සිරිසේන මහතා.

(18) හා. ප. මැදවල, අත්තරගම, අංක 175 හි පදිංචි පිටියේ ගෙදර හීන්බණ්ඩා මහතා.

(19) වැරැල්ලගම, බෝලගලපාර, ජයන්ති අංක 25/1 හි පදිංචි එගොඩගේ ආනන්ද ගාමිණී ජයසිංහ මහතා.

(20) හා. ප. මැදවල, බෝතොට, අංක 101 හි පදිංචි ශ්‍රී රාම බ්‍රහ්මණ අනපත්තු මුදියන්සේලාගේ විකිරිබණ්ඩා බෝතොට මහතා.

(21) හා. ප. මැදවල, පල්ලේ ඉහගම, අංක 66 හි පදිංචි රුප්පක්ෂ ගෙදර උපනන්ද මහතා.

(22) හා. ප. මැදවල, මගුරුදෙනිය, අංක 14 හි පදිංචි පහල ගෙදර පේමසිරි මහතා.

(23) වැරැල්ලගම, කුරුඳුගොල්ල, 'පව්සිස්ටාන්' හි පදිංචි ඉහළ ගෙදර මොහමඩ් තම්බි ලෙබ්බේ ආලිම්ෂාහ්බි මොහමඩ් සුබයිර් මහතා.

(24) හා. ප. මැදවල, අංගොඩ, අංක 189 හි පදිංචි අංගොඩ පිහිලිඅංගේ ගුණදාස ගුණවර්ධන මහතා.

(25) කුඹුරේගම, අරඹෙකඩේ පදිංචි මරවනාගොඩ පල්ලේ ගෙදර සුන්දරසේන මහතා.

(26) කුඹුරේගම ගිරිහාගම පදිංචි කුලතුංග මුදියන්සේලාගේ මුතු බණ්ඩා කුලතුංග මහතා.

(27) කුඹුරේගම, ගිරිහාගම පදිංචි ගිරිහාගම හතුරුසිංහගේ සේරසිංහ මහතා.

(28) හරංකහව, කඳන්ගේන පදිංචි අංකුඹුරේ ගෙදර අමරසේන මහතා.

(29) වැරැල්ලගම, ඉඩමේගම පදිංචි ඇල්ලෙපොල හේරත් මුදියන්සේලාගේ වලව්වේ සෝමරත්න මහතා.

(30) වැරැල්ලගම, මරවනාගොඩ පදිංචි වීරසිංහගෙදර ආතර් වීරසිංහ මහතා.

(ආ) හා. ප. මැදවල, දොරණෑගම, අංක 151 හි පදිංචි කඳුරේ බණ්ඩාරනායක වලව්වේ ලොකුබණ්ඩා දොරණෑගම මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නියම කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 සැප්තැම්බර් මස 7 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

9–579/2—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

### සමගි මණ්ඩල පනත

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රය සමග කිය විය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3 (7) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින් නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම, කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටි මඩහපොල ගම් ප්‍රදේශය සඳහා 1972 මාර්තු මස 24 වැනි දින අංක 15,003 දරන ගැසට් නිවේදනය මගින් සංස්ථාපනය කරනු ලැබූ සමගිදායක සභාවේ සාමාජික, මැල්සිරිපුර, උස්සාව පදිංචි එල්. ඩබ්ලිව්. එල්. රාජසේකර මහතා එකී තනතුරින් ඉවත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 සැප්තැම්බර් මස 7 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

–578—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

### සමගි මණ්ඩල පනත

#### 3 (2) වන වගන්තිය යටතේ වූ දැන්වීම

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් නිවේදනය සමග කිය විය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3 වන වගන්තියේ (2) වැනි උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින් නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම, මීට යාකොට ඇති උපලේඛන යෙහි නිශ්චිතව සඳහන් එක් එක් ප්‍රදේශය සඳහා සමගිදායකයින්ගේ මණ්ඩලයක් සංස්ථාපනය කිරීමට අදහස් කරන බවත්, ඒ එක් එක් ප්‍රදේශයෙහි සමගිදායකයින්ගේ මණ්ඩලයට පත් කළ යුතු තැනැත්තන් සම්බන්ධයෙන් ඒ වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ නිර්දේශයක් ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කාර්යාලයේ ඇති ආකෘති පත්‍රය මගින් 1973 ඔක්තෝබර් මස 30 වැනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ඉදිරිපත් කළ හැකි බවත් මෙයින් දැනුම් දෙමි:—

සමගි මණ්ඩල පාලන ලේකම්,
අධිකරණ අමාත්‍යාංශය,
කොළඹ 12.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 සැප්තැම්බර් මස 7 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

#### උපලේඛනය

1. ගාල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි පහල ගම්හය ගම් ප්‍රදේශය
2. ගාල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි වතුගෙදර සුළු නගර සභා ප්‍රදේශය
3. කෑගල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි පනාවල් කෝරලේ ගම් ප්‍රදේශය
4. කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටි රම්බඩගල්ල ගම් ප්‍රදේශය
5. බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි රිල්පොල ගම් ප්‍රදේශය
6. බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි නල්දෙන ගම් ප්‍රදේශය
7. බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි ඌව-පරණගම ගම් ප්‍රදේශය
8. බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි වැලිමඩ සුළු නගර සභා ප්‍රදේශය
9. බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි යටි පළාත ගම් ප්‍රදේශය.
10. මහනුවර දිස්ත්‍රික්කය තුළ පිහිටි උඩුනුවර සාඳුපලාත ගම් ප්‍රදේශය
11. මාතලේ දිස්ත්‍රික්කය තුළ පිහිටි විගපනාහ උඩඩියපත්තුව ගම් ප්‍රදේශය
12. නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ පිහිටි යටිපලාත ගම් ප්‍රදේශය
13. කළුතර දිස්ත්‍රික්කය තුළ පිහිටි ධර්ගාටවුන් සුළු නගර සභා ප්‍රදේශය
14. යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි පණ්ඩතෙරුප්පු සුළු නගර සභා ප්‍රදේශය
15. යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි මානිපේ සුළු නගර සභා ප්‍රදේශය
16. යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි චුන්නාකම් සුළු නගර සභා ප්‍රදේශය
17. යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි උරුම්පිරායි-ඌරෙලු සුළු නගර සභා ප්‍රදේශය
18. යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි මුහම්දාලෙයි ගම් ප්‍රදේශය
19. යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි පොලොපලෙයි ගම් ප්‍රදේශය
20. යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි මුල්ලිපත්තු ගම් ප්‍රදේශය
21. යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි කරච්චි ගම් ප්‍රදේශය
22. යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි තුණුක්කායි ගම් ප්‍රදේශය
23. යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි පල්ලවරායන්කඩ්ඩු ගම් ප්‍රදේශය
24. යාපනය දිස්ත්‍රික්කය තුළ පිහිටි ඉරණෛයිතිව් ගම් ප්‍රදේශය
25. වවුනියා දිස්ත්‍රික්කය තුළ පිහිටි කරිකාඩ්ඩුමුලෙයි උතුර ගම් ප්‍රදේශය
26. වවුනියා දිස්ත්‍රික්කය තුළ පිහිටි කරිකාඩ්ඩුමුලෙයි දකුණ ගම් ප්‍රදේශය
27. වවුනියා දිස්ත්‍රික්කය තුළ පිහිටි කරිකාඩ්ඩුමුලෙයි බටහිර ගම් ප්‍රදේශය
28. වවුනියා දිස්ත්‍රික්කය තුළ පිහිටි මේල්පත්තු නැගෙනහිර ගම් ප්‍රදේශය
29. වවුනියා දිස්ත්‍රික්කය තුළ පිහිටි මේල්පත්තු උතුර ගම් ප්‍රදේශය
30. වවුනියා දිස්ත්‍රික්කය තුළ පිහිටි මේල්පත්තු දකුණ ගම් ප්‍රදේශය
31. මඩකලපුව දිස්ත්‍රික්කය තුළ පිහිටි ඒරාවූර් සුළුනගර සභා ප්‍රදේශය

9–577—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

### සමගි මණ්ඩල පනත

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජුනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(7) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින් නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම, පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ පිහිටි මැදිරිගිරිය ගම් ප්‍රදේශය සඳහා 1973 මාර්තු මස 23 වැනි දින අංක 52 දරන ගැසට් නිවේදනය මගින් සංස්ථාපනය කරනු ලැබූ සමගිදායක සභාවේ සාමාජික හිඟුරක්ගොඩ, මීගස්වැව පදිංචි ඩිංගිරි බණ්ඩාගේ කරුණාරත්න මහතා එකී තනතුරින් ඉවත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 සැප්තැම්බර් මස 7 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

9-576—1973. 09. 21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

### සමගි මණ්ඩල පනත

#### ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජුනි මස 12 වැනි දින අංක 11/2 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම ;

(අ) 1972 දෙසැම්බර් මස 1 වැනි දින අංක 36 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3 (2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උපලේඛනයෙහි අංක 8 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ පිහිටි මැදවච්චි ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) ගෝරමන්කඩවල, මැදවච්චිය පදිංචි ආරුකච්චු පටබැඳිගේ විලියම්සිල්වා මහතා.
(2) ගෝරමන්කඩවල, මැදවච්චිය පදිංචි හේරත්හාමිගේ ප්‍රේමදාස මහතා.
(3) ගෝමරන්කඩවල, මැදවච්චිය පදිංචි දයාරත්නගේ කිරිබංඩා මහතා.
(4) ගෝමරන්කඩවල, පුලිකණ්ඩිකුලම පදිංචි සිරිවර්ධනගේ ධර්මදාස මහතා.
(5) ගෝමරන්කඩවල, කිව්ලේකඩ පදිංචි කන්දප්පුරාලගේ දසනායක මහතා.
(6) ගෝමරන්කඩවල, අඹම්පනේ පදිංචි මොහොට්ටිහාමිගේ කරුණාදාස මහතා.
(7) ගෝමරන්කඩවල, කිව්ලේකඩ පදිංචි දිසානායකගේ පියරත්න මහතා.
(8) ගෝමරන්කඩවල, කිව්ලේකඩ පදිංචි වන්නකුරාලගේ ධර්මදාස මහතා.
(9) ගෝමරන්කඩවල, කිව්ලේකඩ පදිංචි වෙලෑතෙගේ පුංචිබංඩා මහතා.
(10) ගෝමරන්කඩවල, කිව්ලේකඩ පදිංචි අවුසදහාමිගේ ටිකිරිබංඩා මහතා.
(11) ගෝමරන්කඩවල, කිව්ලේකඩ පදිංචි අවුසදහාමිගේ රංබණ්ඩා මහතා.
(12) ගෝමරන්කඩවල, අඹම්පනේ පදිංචි බංඩාතෙගේ අප්පුහාමි මහතා.
(13) ගෝමරන්කඩවල, අඹම්පනේ පදිංචි කදිරවේලාතෙගේ කරුණාදාස මහතා.
(14) ගෝමරන්කඩවල, පුලියන්ඩිකුලම පදිංචි උක්කුබංඩාගේ කුලසේකර මහතා.
(15) ගෝමරන්කඩවල, පුලිකන්ඩිකුලම පදිංචි මල්හාමිගේ පියදාස මහතා.
(16) ගෝමරන්කඩවල, බක්මීකඩ පදිංචි සිංගිරාලගේ කදිරාතේ මහතා.
(17) ගෝමරන්කඩවල, බක්මීකඩ පදිංචි අප්පුරාලයගේ මල්හාමි මහතා.
(18) ගෝමරන්කඩවල, මැදවච්චිය පදිංචි කිරිහාමිගේ ධනපාල මහතා.
(19) ගෝමරන්කඩවල, මැදවච්චිය පදිංචි වන්නිහාමිගේ ගුණරත්න මහතා.
(20) ගෝමරන්කඩවල, පුලිකන්ඩිකුලම පදිංචි උක්කුබංඩාගේ ගුණසේකර මහතා.

(ආ) ගෝමරන්කඩවල, මැදවච්චිය පදිංචි ආරුකච්චු පටබැඳිගේ විලියම් සිල්වා මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥාව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 සැප්තැම්බර් මස 11 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

9-575—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

### පඩිපාලක සභා ආඥාපනත

#### නිවේදනයයි

1973 සැප්තැම්බර් මස 01වැනි දින සිට අවුරුදු තුනක කාලයක් තුළ බී කෙටීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයින් වශයෙන් පෙනී සිටීමට (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ කම්කරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව 1971 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 30 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝඟලි මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1973 සැප්තැම්බර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

**නම නියමකොට පත්කරන සාමාජිකවරු :**

1. පී. ඒකනායක මහතා
2. ඇස්. ආර්ජ්. ද සිල්වා මහතා
3. ජේ. ඩබ්ලිව්. රණසිංහ මහතා

**සේව්‍ය නියෝජිත සාමාජිකවරු :**

1. ජේ. සහාරත්නම් මහතා
2. ඩබ්ලිව්. ආර්. ඇම්. පී. ජයවර්ධන මහතා
3. ඇම්. බී. අබේවර්ධන මහතා
4. ඒ. එච්. ඊ. ඩව්සන් සිල්වා මහතා
5. ඩී. ඩබ්ලිව්. නානායක්කාර මහතා
6. ආර්. ඇස්. විජේතුංග මහතා
7. සී. රාසනායගම් මහතා
8. ඇස්. ඒ. මජීඩ් මහතා
9. චන්ද්‍රසේන ජයසිංහ මහතා

**සේවක නියෝජිත සාමාජිකවරු :**

1. ඇල්. ඩබ්ලිව්. පණ්ඩිත මහතා
2. ඇස්. බස්නායක මහතා
3. එච්. ඩබ්ලිව්. සයිමන් සිංඤෝ මහතා
4. ඇස්. ලෙස්ලි ප්‍රනාන්දු මහතා
5. වී. වික්ටර් පෙරේරා මහතා
6. සුසිල් ගුරුගේ මහතා
7. ඩග්ලස් අබේදීර මහතා
8. ඉස්වීන් ප්‍රනාන්දු මහතා
9. ඩබ්ලිව්. ඒ. චන්ද්‍රදාස මහතා

9-568—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

## බන්ධනාගාර ආඥා පනත

### 35(1) වැනි වගන්තිය යටතේ නිවේදනය

(54 වැනි අධිකාරය වන) බන්ධනාගාර ආඥා පනතෙහි 35(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වැඩ බලන අධිකරණ ඇමති, රත්නසිරි වික්‍රමනායක වන මම වැලිකඩ බන්ධනාගාරය සඳහා ප්‍රාදේශීය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් 1973 සැප්තැම්බර් මස 1 වැනි දින ආරම්භ වන එක් වර්ෂයක කාලයක් සඳහා කේ. එම්. ඒ. හසන් මහතා, ඩබ්ලිව්. කුසුමන් ප්‍රනාන්දු මහතා, ආර්. ආනන්දසිංහ මහතා සහ එරින් සේනානායක මහත්මිය මෙයින් පත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
වැඩබලන අධිකරණ ඇමති.

1973 අගෝස්තු මස 31 දින,
කොළඹ දී ය.

9-521—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර ආඥා පනත

### 35(1) වැනි වගන්තිය යටතේ නිවේදනය

(54 වැනි අධිකාරය වන) බන්ධනාගාර ආඥා පනතෙහි 35(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වැඩබලන අධිකරණ ඇමති, රත්නසිරි වික්‍රමනායක වන මම, බදුල්ල බන්ධනාගාරය සහ තල්දෙන තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය සඳහා ප්‍රාදේශීය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන්, 1973 සැප්තැම්බර් 1 වැනි දින ආරම්භ වන එක් වර්ෂයක කාලයක් සඳහා ජී. ඩී. දිසිනෝරිස් අප්පුහාමි මහතා, එම්. ආර්. කරුණාරත්න මහතා, ඒ. පකීර්දීන් මහතා හා ඒ. ආර්. එම්. ඒ. කාදර් මහතා මෙයින් පත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
වැඩබලන අධිකරණ ඇමති.

1973 සැප්තැම්බර් මස 7 වැනි දා,
කොළඹ,
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

9-520—73.09.21 දින අංක 78 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා විද්‍යාභිවර්ධන සංගමය

### 1966 අංක 11 දරණ ආඥා පනත

1966 අංක 11 දරණ පනත යටතේ ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ අංක 9, 10 සහ 11 යන ව්‍යවස්ථාවලින් පොදු කාරක සභාව වෙත පවරා ඇති බලතල යටතෙහි යථෝක්ත සංස්ථාවේ ව්‍යවස්ථා හා නීතිරීති සංශෝධන යයි.

(මෙම සංශෝධන 1972 දෙසැම්බර් මස 16 දින පැවැත්වූ 28 වෙනි මහා සභා රැස්වීමේදී අනුමත කරන ලදී)

(අ) 6 වෙනි ව්‍යවස්ථාවේ අංක 2 දරණ ව්‍යවස්ථාව මෙසේ කියැවීමෙන් සංශෝධනය වන්නේය.

(A) වෛද්‍ය හා පශු වෛද්‍ය විද්‍යා,

(B) කෘෂි විද්‍යා හා වන විද්‍යාව,

(C) ඉංජිනේරු, ගෘහ නිර්මාණ සහ මැනුම්,

(D) ස්වභාව විද්‍යා (උද්භිද, සත්ත්ව, ධීවර, භූ, සහ ඛනිජ),

(E) භෞතික විද්‍යාව (රසායන, ජෛව රසායන, භෞතික වේද, ගණිත, සංඛ්‍යා විස්තර, තාරකා හා ආකාශ වස්තු),

(F) සමාජ විද්‍යා (මානව විද්‍යාව, පුරා වස්තු විද්‍යා ජනලේඛන, අර්ථ ශාස්ත්‍ර, අධ්‍යාපන, භූගෝල, මනෝ විඥ්ඥාන සහ සමාජ විද්‍යා).

(ආ) 8 වෙනි වගන්තිය (අලුතින්) මෙසේ ඇතුළත් විය යුතුය.

### 8. විද්‍යා ව්‍යාප්ති කමිටුව

පරමාර්ථය :

1. විද්‍යාව ව්‍යාප්ත කිරීම පිණිස සංගමය විසින් "විද්‍යා ව්‍යාප්ති කමිටුව" නමින් කාරක සභාවක් පිහිටුවනු ලැබේ.

සංස්ථාපනය

2. පොදු කාරක සභාව විසින් දහඅට දෙනෙකුගෙන් යුත් "විද්‍යා ව්‍යාප්ති කමිටුව" ක් තෝරා පත් කරනු ලැබේ. මෙම කමිටුවට පත් කිරීමට සුදුසුකම් ඇති සාමාජිකයින්ගේ නම් විධායක මණ්ඩලය විසින් යෝජනා කර පොදු කාරක සභාවට ඉදිරිපත් කළ යුතුය. සංගමයේ අංශ සියල්ලම නියෝජනය වන පරිදි එක අංශයකින් යටත්පිරිසෙයින් එක සාමාජිකයෙකු බැගින් වත් යෝජනා කළ යුතුවූ අතර සංගමයේ නියෝජ්‍ය සභාපති නිල බලයෙන්ම කමිටුවේ සාමාජිකයෙකු විය යුතුය.

වසරක් පාසාම විද්‍යා ව්‍යාප්ති කමිටුවේ සාමාජිකයින් විසින් කමිටුවේ සාමාජිකයින් අතුරින් එම කමිටුවේ සභාපති හා ලේකම් තෝරා පත් කරගත යුතුවූ අතර එකී කමිටුවට අවශ්‍ය නීති, රීති සකස් කරගත යුතු වන්නේය. එසේ පනවන නීති, රීති, සංගමයේ නීති, රීතිවලට පටහැනි නොවිය යුතුය.

බලතල හා යුතුකම්

3. විද්‍යා ව්‍යාප්ති කමිටුවේ බලතල හා යුතුකම් :—

(අ) රටේ උන්නතිය උදෙසා විද්‍යාව ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම ;

(ආ) පොදු ජනතාවට හෝ ඕනෑම පුද්ගලයෙකුට සහ/හෝ ආයතනයකට හෝ විද්‍යාත්මක ආකල්පයක් ඇති කරවීම් වස් හා එදිනෙද ජීවිතයට විද්‍යාත්මක ක්‍රම ඇතුළත් වන අයුරින් හා විද්‍යාත්මක අදහස් තහවුරු වන අයුරින් ඔවුන්ගේ නානාවිධ ක්‍රියාවන් සකස් කරවාගැනීමට උපදෙස් දීම ;

(ඇ) විද්‍යාව ව්‍යාප්ත කිරීම සඳහා යථෝක්ත පරමාර්ථයන් ඉටු කරවීම සඳහා අවශ්‍ය යැයි හැඟෙන අයුරින් ක්‍රියා කිරීම ;

(ඈ) විධායක මණ්ඩලයට අවශ්‍ය වන අර්ධ වාර්ෂික හා වාර්ෂික වාර්ත සැපයීම.

අරමුදල්

4. (අ) "විද්‍යා ව්‍යාප්ති අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදල කට වසරක් පාසා ලංකා විද්‍යාභිවර්ධන සංගමය විසින් විද්‍යා ව්‍යාප්ති කමිටුවට අවශ්‍ය මුදල් වෙන් කළ යුතු වන අතර විධායක මණ්ඩලයේ අනුමැතියෙන් යථෝක්ත අරමුදලට දීමනාවන්/පරිත්‍යාග හා උරුමයන් හෝ වෙනත් එවැනි අයුරින් අතිරේක ආධාර ලබාගත හැකිය.

(ආ) "විද්‍යා ව්‍යාප්ති අරමුදල" ට ලැබෙන සියළුම අරමුදල් සංගමයේ භාණ්ඩාගාරිකවරයා විසින් ලැබිය යුතු වන අතර ඒ සඳහා ලදුපත් නිකුත් කර එසේ ලැබෙන අරමුදල් ඔහු විසින් වෙනම ගිණුමක පවත්වාගෙන යා යුතුය.

